# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2441/27 - 2025 ජුනි මස 18 වැනි බදාදා - 2025.06.18**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**උතුරු පළාතේ පළාත් සභාව**

**1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනත සමඟ කියැවෙන 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත් වලින් සංශෝධනය වූ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත**

**බලතල පැවරීම**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනත සමඟ කියැවෙන 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 2(2) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇත්තා වූ බලතල ප්‍රකාරව, උතුරු පළාතේ ආණ්ඩුකාර නා. වෙදනායහන් මහත්මිය වන මම, උතුරු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්ට සහාය වීමට පත් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවෙහි සඳහන් එක් එක් තැනැත්තෙකුටම, 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) හා 1992 අංක II දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත හා ඒ යටතේ පනවා ඇති රීති මාලාව යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තා වූ බලතල, එම උපලේඛනයේ III වැනි තීරුවෙහි සඳහන් බලතල වත්මන්හි තම බල ප්‍රදේශය තුළ එම උපලේඛනයේ II වැනි තීරුවෙහි සඳහන් දිනයේ සිට ක්‍රියාත්මක කිරීමට මෙම නියෝගය මඟින් පවරමි.

**නා.වෙදනායහන්**
ආණ්ඩුකාරවර,
උතුරු පළාත.

2025 අප්‍රේල් මස 30 වැනි දින,

1A - PG 7159 - 14 (2025/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය*

| *I තීරුව* | *II තීරුව* | *III තීරුව* |
|---|---|---|
| 1. පාලසිංකම් සිරිකුමාර්<br>2. පුෂ්පරාණි පුවනේශ්වරන්<br>3. බාලමුරලි කලෛයිවෙල්වි | 2024.11.25<br>2024.11.25<br>2024.11.25 | සමුපකාර සමිති පනතේ 3,4(4(2) හැර) 5,6,7,8,33,39,42,43,44,(44(6) හැර) 45,46,50,52,53,54,58(58(2)(අ) සහ 58(5) හැර) 59,68,72 යන වගන්තීන් යටතේ වන රෙජිස්ට්‍රාර්ගේ සියලුම බලතල සහ සමුපකාර රීතිමාලා මාලාවලින් 4,11,15,16(ii),18,19,20,27,32,33,35,37,39,40, 41,42,43,48,49,(49(xii) හැර) 52,53 යන රීතිමාලා යටතේ වන සියලුම බලතල. |

EOG 06 - 0151

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.